# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2035/51 - 2017 සැප්තැම්බර් මස 08 වැනි සිකුරාදා - 2017.09.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 24/51 (iv)

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

නිමල් සිරිපාල ද සිල්වා,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2017 සැප්තැම්බර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2017 අංක 04 දරන මෝටර් වාහන (මෝටර් ට්‍රයිසිකල්) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 2017 ඔක්තෝබර් මස 1 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. (1) කුළියට තැනැත්තන් ප්‍රවාහනය කිරීමේ කාර්යය සඳහා අන්‍යාකාරයකින් යම් මෝටර් ට්‍රයිසිකලයක් භාවිතා කරනු ලබන සෑම මෝටර් ට්‍රයිසිකලයක අයිතිකරුවකු විසින් ම, යම් මගියකු ඇතුල්වීම හෝ පිටවීම වැළැක්වෙන පරිදි මෝටර් ට්‍රයිසිකලයේ මගී මැදිරියේ (දකුණු පස) පිටවීමේ දොරටුව අර්ධ වශයෙන් හෝ පූර්ණව ස්ථිර වශයෙන් වසා ඇති බවට සහතික විය යුතු ය.

(2) (අ) මෝටර් ට්‍රයිසිකලයක රියදුරෙකු විසින් මෝටර් ට්‍රයිසිකලයේ දකුණු පස දොරටුවෙන් මෝටර් ට්‍රයිසිකලයට ඇතුල්වීම හෝ පිටවීම සඳහා කිසිම මගියකුට ඉඩ ලබා නොදිය යුතු ය.

(ආ) කිසිම තැනැත්තකු මෝටර් ට්‍රයිසිකලයේ දකුණු පස දොරටුවෙන් මෝටර් ට්‍රයිසිකලයට ඇතුල්වීම හෝ පිටවීම නොකළ යුතු ය.


1A - PG 3685 — 507 (2017/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

;



3. යම් මෝටර් ට්‍රයිසිකලයක අයිතිකරුවකු විසින්-

(අ) මෝටර් ට්‍රයිසිකලයක සියලු ආසනවල ආධාරක ස්ථානගත කර සවිකර තිබිය යුතු අතර, එය එක් එක් ආසනය ඉදිරියෙන් ඍජු රේඛාවක් ඔස්සේ එක් එක් වැඩිහිටියකු සහ ළමයෙකු වෙනුවෙන් පිළිවෙලින් අවම වශයෙන් මිලිමීටර් 382ක සහ මිලිමීටර් 250ක ඉඩ ප්‍රමාණයක් ලබා දිය යුතු බවට ; මේ නියෝගයේ කාර්යයන් සඳහා වයස අවුරුදු තුනේ සිට වයස අවුරුදු දෙළහ අතර ළමුන් එක් ළමයෙකු ලෙස ගණනය කරනු ලැබිය යුතු ය.

(ආ) මෝටර් ට්‍රයිසිකලයක රියදුරු අසුනේ ඉදිරි කෙළවර සහ උපකරණ පුවරුවේ ආසන්නතම ස්ථානයේ සිරස් තලය අතර ඇති කෙටිම දුර මිලිමීටර් 300කට වඩා අඩු නොවිය යුතු බවට ;

(ඇ) මෝටර් ට්‍රයිසිකලයක මඟී අසුනේ ඉදිරි කෙළවර සහ ඉදිරි ආසනයක පිට ඇන්දේ ආසන්නතම ස්ථානයේ සිරස් තලය අතර ඇති කෙටිම දුර ප්‍රමාණය මිලිමීටර් 230ට වඩා අඩු නොවිය යුතු බවට ;

(ඈ) මෝටර් ට්‍රයිසිකලයක සවිකර ඇති එක ළඟ ඇති ආසන දෙකෙහි පිටඇන්ද අතර අවම පරතරය මිලිමීටර් 660 කට වඩා අඩු නොවිය යුතු බවට ;

(ඉ) එකිනෙකට මුහුණලා ඇති ආසන මෝටර් ට්‍රයිසිකලයට සවි නොකළ යුතු බවට ; සහ

(ඊ) මෝටර් ට්‍රයිසිකලයේ උස පළලින් සියයට එකසිය පනහකට වඩා වැඩි නොවිය යුතු බවට.

සහතික විය යුතු ය.

4. මෝටර් ට්‍රයිසිකලයක රියදුරු හැර වෙනත් කිසිම තැනැත්තකු රියදුරු මැදිරියේ හෝ රියදුරු ආසනයේ රැගෙන නොයා යුතු ය.

5. මෝටර් ට්‍රයිසිකලයේ වේග සීමාව 2012 ජූනි මස 22 වැනි දින අංක 1763/26 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 2012 අංක 1 දරන මෝටර් රථ වාහන (වේග සීමා) නියෝගවල විධිවිධානවලට යටත් විය යුතු ය.

6. මෝටර් ට්‍රයිසිකලය මාර්ගයේ ගමන් කිරීමේ දී මෝටර් ට්‍රයිසිකලයේ අයිතිකරු හෝ රියදුරු විසින් කිසිම තැනැත්තකුට වෙළෙඳ දැන්වීම්, පත්‍රිකා හෝ අත්පත්‍රිකා බෙදා දීමට හෝ වාහනයෙන් පිටතට නෙරා යන පරිදි යම් භාණ්ඩ ගෙනයාමට අවසර ලබා නොදිය යුතු ය.

7. ධාවනයේ යෙදී සිටින හෝ නවතා ඇති යම් මෝටර් ට්‍රයිසිකලයක රියදුරකු විසින් වෙනත් මාර්ග භාවිත කරුවන්ට බාධාවන හෝ පීඩාවන ආකාරයේ ශබ්දයක් ඇති කරවන යම් උපකරණයක් හෝ උපාංගයක් භාවිත කිරීම හෝ භාවිත කිරීමට කටයුතු සැලැස්වීම නොකළ යුතු ය. ශබ්දය මෝටර් ට්‍රයිසිකලය තුළට පමණක් සීමා වන බවත් එහි සිටින තැනැත්තන්ට පමණක් ඇසෙන පරිදි අදහස් කළ බවත් තහවුරු කිරීමට එම ශබ්දය පාලනය කළ යුතු ය.

8. (1) මෝටර් ට්‍රයිසිකලයක අයිතිකරු හෝ රියදුරු විසින් -

(අ) මෝටර් ට්‍රයිසිකලය පදවනු ලබන රියදුරු විසින් සියලු අවස්ථාවල දී තමා විසින් පදවනු ලබන වේගය පැහැදිලිව දැකගැනීම සඳහා වේගමානය යථා පරිදි මෝටර් ට්‍රයිසිකලයට සවිකර ඇති බවට ;

(ආ) මෝටර් ට්‍රයිසිකලයේ ඉදිරිය බාධා රහිතව දර්ශනය කර ගැනීමට මෝටර් ට්‍රයිසිකලයේ රියදුරුට හැකිවන පරිදි විද්‍යුත් ලෙස හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ක්‍රියාත්මක වන වා මුවා පිස්න සවිකර ඇති බවට;

(ඇ) මෝටර් ට්‍රයිසිකලයට වායු ටයර සවිකර ඇති බවට සහ ඒවා වෙනස් ප්‍රමාණයන්ගෙන් පවතී නම්, අවම වශයෙන් ඒ එක් එක් ප්‍රමාණයන්ගෙන් එවැනි ආකාරයෙන් ම සුළං පුරවන ලද අතිරේක ටයරයක් රැගෙන යා යුතු බවට;

(ඈ) මෝටර් ට්‍රයිසිකලය මාර්ගයේ නවතා ඇති අතරතුර දී මෝටර් ට්‍රයිසිකලයේ රෝදයට හෝ ඇක්සලයට සුළං පුරවන ලද අතිරේක ටයරය කඩිනමින් සවිකිරීමට භාවිතා කළ හැකි අවශ්‍ය උපාංග සෑම මෝටර් ට්‍රයිසිකලයකම රැගෙන යන බවට ; සහ

(ඉ) රියදුරා හා මඟීන් කාලගුණික තත්ත්වයන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා ආවරණ සවිකර ඇති බවට,

සහතික විය යුතු ය.

(2) පහත දැක්වෙන උපාංග මෝටර් ට්‍රයිසිකලයට සවිකර ඇති බව සහ ඒවා මනා සහ ක්‍රියාකාරී තත්ත්වයෙන් පවතින බවට මෝටර් ට්‍රයිසිකලයේ අයිතිකරු විසින් සහතික විය යුතු ය.

(අ) බාහිර පිටුපස දර්ශන කණ්නාඩි දෙක;

(ආ) ප්‍රධාන සහ අවපාත කළ හැකි දර්ශක පහන් සහිත ප්‍රධාන ලාම්පු සහ දර්ශක;

(ඇ) අවර හෝ නැවතුම් ලාම්පු;

(ඈ) පැති දිසා පෙන්නුම් කිරීමේ ලාම්පු;

(ඉ) පසුපස ධාවනය සඳහා ලාම්පු;

(ඊ) නවතා තැබීමේ ලාම්පු; සහ

(උ) නලාව.

9. යම් ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් සඳහා තැනැත්තන් හෝ භාණ්ඩ රැගෙන යාමේ කාර්ය සඳහා මෝටර් ට්‍රයිසිකලය භාවිතා කරනු ලබන අවස්ථාවකදී -

(අ) මගීන්ට පැහැදිලිව පෙනෙන පරිදි රියදුරු අසුන පිටුපස පහත දැක්වෙන තොරතුරු ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(i) ලියාපදිංචි අංකය;

(ii) රියදුරුගේ නම සහ රියදුරු බලපත්‍ර අංකය;

(iii) රියදුරුගේ ඡායාරූපයක් (මිලිමීටර් 65 x 50 ප්‍රමාණයේ); සහ

(iv) හදිසි අවස්ථාවක දැනුම් දීම සඳහා වාහනය ලියාපදිංචි වී ඇති අදාළ පොලිස් ස්ථානවල දුරකතන අංක; සහ

(ආ) මෝටර් ට්‍රයිසිකලයක රියදුරු විසින් තමා සේවයේ යෙදී සිටින සෑම අවස්ථාවකදීම-

(i) ආචාර සම්පන්න සහ විධිමත් ආකාරයට හැසිරිය යුතු ය;

(ii) දුම්පානය නොකළ යුතු ය;

(iii) කුලී රථයක් ලෙස පාවිච්චි කිරීමෙන් නිදහස් කරනු ලබන තෙක් එම කාර්ය අවසන් නොකළ යුතුය; සහ

(iv) මගීන් විසින් අන්‍යාකාරයකින් ඉල්ලා සිටින්නේ නම් මිස, අඩුම කාලයක් තුළ යා හැකි කෙටිම මාර්ගය ඔස්සේ මගීන් ස්වකීය ගමනාන්තය කරා රැගෙන යා යුතු ය.

10 (1) කුලියට තැනැත්තන් හෝ භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා හෝ අන්‍යාකාරයකින් මෝටර් ට්‍රයිසිකලයක් භාවිතා කරනු ලබන සෑම මෝටර් ට්‍රයිසිකලයකම අයිතිකරු විසින් සියලු අවස්ථාවලදී ක්‍රියාත්මකව පවතින ටැක්සි මීටරයක් එහි තිබිය යුතු ය.

(2) එම ගාස්තුව ගෙවීමෙන් පසුව, මගියාගේ ඉල්ලීම මත රිසිට්පතක් නිකුත් කිරීම එම මෝටර් ට්‍රයිසිකලයේ රියදුරාගේ වගකීම විය යුතු ය. එම රිසිට් පතෙහි ගමන් කළ දුර, වාහන ලියාපදිංචි අංකය, අය කළ ගාස්තුව සහ ලබාගත් දිනය ඇතුලත් විය යුතු ය.

11. මෝටර් ට්‍රයිසිකලයක අයිතිකරු විසින් එහි නිෂ්පාදක විසින් ඒ මත ලකුණු කරනු ලබන විස්තරාත්මක තොරතුරු හැර මෝටර් ට්‍රයිසිකලයේ ඉදිරිපස හෝ පසුපස අකුරු ඉලක්කම් හෝ සංඛ්‍යා ලකුණු කර නොමැති බවට සහතික විය යුතුය.

12. 2017 ජනවාරි මස 09 වැනි දින 2001/2 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ 2017 අංක 1 දරන මෝටර් වාහන (මෝටර් ට්‍රයිසිකල්) නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

13. මෙම නියෝගවල "මෝටර් ට්‍රයිසිකලය" යන්නට (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ සඳහන් අර්ථය ම ඊට තිබිය යුතු ය.

9-636

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.